සියලුම හිමිකම් ඇවිරිණි.
All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**

# දෙවන වාර පරීක්ෂණය 2018

**08 ශ්‍රේණිය** **චිත්‍ර කලාව** **කාලය පැය 02 යි.**

| නම/ විභාග අංකයඃ |
|---|

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේම ලියන්න.

---

## I කොටස

- ප්‍රශ්න අංක 01 - 05 දක්වා අසා ඇති ප්‍රශ්නවලට **A B C D E** රූප සටහන් ඇසුරින් පිළිතුරු සපයන්න.



A B C D E

01 A අක්ෂරයෙන් දැක්වෙන රූපය සම්ප්‍රදායික සැරසිලි මෝස්තරවල කුමන කාණ්ඩයට අයත්ද?

.......................................................................................................

02 B අක්ෂරයෙන් දැක්වෙන සම්ප්‍රදායික මල් මෝස්තරය නම් කරන්න.

.......................................................................................................

03 C අක්ෂරයෙන් දැක්වෙන මෝස්තරය කුමන නමකින් හැඳින්වේ ද?

.......................................................................................................

04 D අක්ෂරයෙන් දැක්වෙන්නේ පැරණි ශිල්පියා ගෝලයාට ලබාදුන් මුල්ම රේඛා අභ්‍යාසයයි. එය හඳුන්වනු ලබන නම කුමක් ද? .......................................................

05 E අක්ෂරයෙන් දක්වා ඇති මෝස්තරය ලාක්ෂා හා පිත්තල කර්මාන්තයට අමතරව දැකිය හැක්කේ කුමන කර්මාන්තයක ද?

.......................................................................................................

- ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්නවලට වඩාත් ගැලපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

06 ද්විතීයික වර්ණ කාණ්ඩයට අයත් වර්ණ වන්නේ,

(1) රතු, කහ, නිල් වර්ණයන් ය. (2) රතු, කොළ, තැඹිලි වර්ණයන් ය.

(3) දම්, තැඹිලි, කොළ වර්ණයන් ය. (4) කහ, තැඹිලි, දම් වර්ණයන් ය.

07 මුස්ලිම් පල්ලියේ දෙපස ඇති කුළුණු හඳුන්වනු ලබන්නේ,

(1) ශිඛරය නමිනි. (2) මිනාර් නමිනි.

(3) ගෝපුර නමිනි. (4) කුරුසිය නමිනි.

08 පදම්කළ මැටි අවශ්‍ය පරිදි එකතුකරමින් සත්ව රූපයක් නිර්මාණය කිරීමේ ශිල්ප ක්‍රමය වන්නේ,

(1) එකලස් කිරීමයි. (2) නෙලීමයි.

(3) ඇඹීමයි. (4) වාත්තු කිරීමයි.

09 ගද්‍ය හෝ පද්‍ය කොටසකින් මතුවන අදහස වඩාත් තීව්‍ර කිරීම සඳහා අඳිනු ලබන චිත්‍ර හඳුන්වන්නේ,

(1) සන්නිදර්ශන චිත්‍ර (2) ප්‍රකාශන චිත්‍ර

(3) ග්‍රැෆික් චිත්‍ර (4) සම්ප්‍රදායික චිත්‍ර

10 මැටි කලා කර්මාන්තයේදී මල්පෝච්චි, කැට කුඩා පහන් ආදී කුඩා ප්‍රමාණයේ විසිතුරු භාණ්ඩ නිර්මාණය කරන්නේ,

(1) අත් සකපෝරුව භාවිතයෙනි. (2) පා සකපෝරුව භාවිතයෙනි.

(3) මැටි වළලු හා පුවරු ආධාරයෙනි. (4) ඇඹීම හා නෙළීම මගිනි.

- **ප්‍රශ්න අංක 11 සිට 15 දක්වා දී ඇති බෞද්ධ හා හින්දු මුද්‍රා හඳුනාගෙන නම් කරන්න.**

11  ....................................................

12  ....................................................

13  ....................................................

14  ....................................................

15  ....................................................

- ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා දී ඇති වැකිවලට සුදුසු පිළිතුරු යොදා හිස්තැන් පුරවන්න.

16 පහතරට නර්තන සම්ප්‍රදාය හා සම්බන්ධ ශාන්තිකර්මයක් වන්නේ ..............................................................................

17 හින්දු ආගමික ගොඩනැගිල්ල වන කෝවිලෙහි ප්‍රධානතම ගෘහ නිර්මාණ අංගය ....................................... වේ.

18 ථූපාරාම දාගැබ වටා ඇති ගල් කණු වලින් අනාවරණය වන්නේ ඒ වටා ........................................ තිබූ බවයි.

19 මහනුවර .................................... ප්‍රදේශය අතීතයේ සිට නියද පැදුරු කර්මාන්තයට වැඩි ප්‍රසිද්ධියක් උසුලයි.

20 ශ්‍රී ලංකාවේ ප්‍රාග් ඓතිහාසික සිතුවම් දැකිය හැකි අනුරාධපුර දිස්ත්‍රික්කයට අයත් ස්ථානයක් ලෙස ............................................................ ලෙන දැක්විය හැක.

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති වාක්‍ය හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද වරහන් තුළ යොදන්න.**

21 ශ්‍රී ලංකාවේ අතීතයේ සිට පැවත එන නූල් රූකඩ පාරම්පරික ජන කලාවකි. ( )

22 පද්මනිධි, සංඛනිධි යන මුරගල් ථූපාරාම දාගැබේ පිවිසුම් දොරටුවේ දක්නට ඇත. ( )

23 ද්‍රව්‍ය සම්පිණ්ඩනයක් ඇඳීමේ දී ද්‍රව්‍යවල පරිමාණය, පරිමාව හා පර්යාවලෝකය පිළිබඳ සැලකිලිමත් විය යුතුය. ( )

24 අවුකන බුද්ධ ප්‍රතිමාව අභය හෙවත් ආශිර්වාද මුද්‍රාවෙන් යුතු බුදු පිළිමයකි. ( )

25 ''යාග සාලෙයි'' යනු පහන් මඩු ශාන්තිකර්මයේ එන සැරසිල්ලකි. ( )

- **ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා ප්‍රශ්නවලට පහත සඳහන් ඡායාරූපය ඇසුරෙන් පිළිතුරු සපයන්න.**



26 ඉහත රූපයෙන් දැක්වෙන්නේ යුරෝපයේ ........................................................................... යුගයේ සිතුවමකි.

27 මෙම සිතුවම ප්‍රංශයේ මොන්ටිනැක් නුවර අසල ............................................................ ගුහාවේ දැකිය හැක.

28 මෙම ගුහාවේ රේඛා චිත්‍ර, වර්ණ සිතුවම්, අත් සලකුණු ආදී ..................................................... නිර්මාණ සඳහා යොදාගෙන ඇත.

29 මෙම සිතුවම් අතර අඩි 17 ක් දිග ............................................................................ ගවරුව විශිෂ්ට නිර්මාණයකි.

30 ඊතල පහර කා ඉදිරියට පනිමින් සිටින බයිසන් රුව සහ ...................................................... මිනිසකුගේ රුව මෙහි ඇති වැදගත් සිතුවමකි.

(ලකුණු 2 x 30 = 60)

## II කොටස

- **චිත්‍රයේ පසු පිටෙහි ඔබේ විභාග අංකය / නම, පංතිය හා චිත්‍රයේ මාතෘකාව හෝ අංකය සඳහන් කරන්න.**
- **පහත සඳහන් මාතෘකා අතරින් එක් මාතෘකාවක් තෝරාගෙන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.**

01 වෙසක් පෝයදා ගමේ පන්සල

02 දිය බීම සඳහා පැමිණි මුව රංචුවක්

03 පාසලේ ශ්‍රමදාන අවස්ථාවක්

04 ගවුම් රෙද්දකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් සත්ව රූපයක් ඇසුරෙන් නිර්මාණය කරන්න.

05 සම්ප්‍රදායික සැරසිලි ඒකක භාවිතා කරමින් සාරි බෝඩරයකට සුදුසු මෝස්තරයක් නිර්මාණය කරන්න.

06 ඔබ සිත්ගත් කතන්දරයක එක් අවස්ථාවක් චිත්‍රයට නඟන්න.

07 ඔබේ පාසලේ පවත්වන විවිධ ප්‍රසංගය සඳහා සුදුසු දැන්වීමක් නිර්මාණය කරන්න.

(ලකුණු 40 යි)

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව** **දෙවන වාර පරීක්ෂණය 2018**

**08 ශ්‍රේණිය** **චිත්‍ර කලාව**

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 01 | දිව්‍ය | 02 | නෙළුම් මල | 03 | ගල් බිංදුව | 04 | වකදෙක | 05 | මැටි/කුඹල් |
| 06 | 3 | 07 | 2 | 08 | 3 | 09 | 1 | 10 | 2 |
| 11 | ධ්‍යාන මුද්‍රාව | | | | | | | | |
| 12 | නමස්කාර මුද්‍රාව | 13 | ධම්මචක්‍ර මුද්‍රාව | 14 | විතර්ක මුද්‍රාව | 15 | ලෝල හස්ත මුද්‍රාව | | |
| 16 | දෙවොල්මඩුව | 17 | ගෝපුර | 18 | චෛත්‍ය ශාලාවක් / ථූපඝරයක් / වටදා ගෙයක් | | | | |
| 19 | දුම්බර | 20 | තන්තිරිමලේ හෝ බිල්ලෑව | 21 | ✓ | 22 | ✗ | 23 | ✓ |
| 24 | ✓ | 25 | ✗ | 26 | ප්‍රාග් ඓතිහාසික | 27 | ලැස්කෝ | 28 | ශිල්ප ක්‍රම |
| 29 | බයිසන් | 30 | බිම වැතිරී සිටින | | | | | | |

(2 x 30 = 60)

I කොටසට ලකුණු 60 යි.

II කොටසට ලකුණු 40 යි.

මුළු ලකුණු 100 යි.